**ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 171 - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

#### 2.1.1 ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් වැය විෂයයන් දෙකක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගන්නා ලද එකතුව රු.49,501,000 ක ප්‍රතිපාදන වලින් රු.30,767,473ක් අදාල කාර්යය සඳහා යොදා ගැනීමකින් තොරව ඉතිරිව තිබූ අතර එය සියයට 58 සිට සියයට සියයක පරාසයක් විය. | කාලය ප්‍රමාණවත් නොවීම, වැඩසටහන් සංශෝධනය කිරීමට සිදු වීම මත ප්‍රතිපාදන ඉතිරි වූ බව. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කර අප්‍රමාදව අදාළ කාර්යයන් සඳහා යෙදවිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 හි දක්වා ඇති විධිවිධානවලින් බැහැරව වැය විෂයන් 5 ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු මගින් වෙන්කර ගෙන තිබූ රු.23,915,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. තවද මු.රෙ. 66 මගින් වැය විෂයයන් 7 ක මුළු ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන් වෙත මාරුකර තිබුණි. | වියදම සීමා කිරීම, මුදල් ලැබීම් ප්‍රමාදවීම, ඉල්ලා නොසිටි වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන ලබාදීම, අරපිරිමැස්මෙන් භාවිතා කිරීම හා කාලපරිච්ඡේදය තුළ අවශ්‍යතාවන් නොමැති වීම ඉතිරිවීම්වලට හේතු වූ බව. | මුදල් රෙගුලාසි අනුගමනය කර නිසි පුරෝකථනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඇ) | අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලබා දී තිබූ රු.35,145,000කින් රු.34,447,244 ක් අධිකාරිය විසින් පුනරාවර්තන වියදම් සඳහා වැයකර තිබුණද අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2025 වසරේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වියදම් නිසි පරිදි වෙන් කරවා ගැනීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසිවලට අනුව අයවැය ඇස්තමේන්තු යටතේ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් පුනරාවර්තන වියදම් සඳහා වැයකල නොහැකි බව අධිකාරිය දැනුවත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මියගිය නිලධාරින් තිදෙනෙකුගෙන් හා විශ්‍රාම ගිය නිලධාරීන් හත් දෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රුපියල් 455,330 ක් හා රු.1,731,541 ක් හා සමාලෝචිත වර්ෂයේ සේවය හැර ගිය නිලධාරීන් පස් දෙනෙකුගෙන් රු.611,006 ක් ලෙස එකතුව රු.2,797,877 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | අයවිය යුතු ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ණය ශේෂ අප්‍රමාදව අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම හා ළමා සුරැකුම් මධ්‍යස්ථාන නියාමනය කිරීම අමාත්‍යාංශයෙහි ප්‍රධාන කාර්යයන් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ද ශ්‍රී ලංකාවේ ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී සංශෝධිත යෝජනා ඇතුළත්කර ප්‍රතිපත්තිය සකස් කරමින් පවතින බව. | ළමා දිවා සුරැකුම් පහසුකම් සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දින වන විට වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා 59 න් එකතුව රු.49,071,128ක් පවතින ශාඛා 29 ක් අක්‍රියව පවතින අතර ශාඛා 07 ක ගිණුම් ශේෂ තොරතුරු කාර්යාංශය සතු නොවීය. | අක්‍රිය ශාඛා 29 ඇවර කිරීම සඳහා අදාළ සියළු තොරතුරු රැස් කර අවසන් බව, | අක්‍රිය ශාඛා ක්‍රියාත්මක කිරීමේ මට්ටමකට ගෙන ඒම හෝ ඇවර කිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ඇ) | වනිතා ශක්ති සුළු මූල්‍ය ශාඛා සඳහා අමාත්‍යාංශය විසින් දරන ලද ප්‍රාග්ධනය හා පරිපාලන වියදම් සඳහා පිළිවෙලින් රු.1,600,000 ක් හා රු.2,101,156 ක් ලෙස එකතුව රු.3,701,156 ක් වැයකර තිබුණද වර්තමානය වන විට එම ශාඛාවල පරිපාලනය, ගිණුම් තැබීම, ණය දීම හා ණය අයකර ගැනීම සක්‍රියව සිදු නොවන බව විගණනයේදී අනාවරණය විය. | ශාඛා 11 ක් පමණක් සක්‍රිය තත්වයේ පවතින බවට වාර්තා වී ඇති අතර, 2023 දෙසැම්බර් 31දිනට යාවත්කාලීන ගිණුම් තොරතුරු ලබා ගැනීමට සහ සුදුසු විගණනයක් සිදු කිරිමට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | යාවත්කාලීන ගිණුම් තොරතුරු ලබා ගැනීමට අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යවසායක කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගාසිටුවීම හා ආර්ථික සවිබල ගැන්වීමේ අරමුණ ඇතිව රු.4,458,063 ක පිරිවැයක් දරා Lanka Women E-market වෙබ් අඩවිය 2022 මාර්තු 08 දින එළි දක්වා තිබුණි.මෙම වෙබ් අඩවිය එළිදක්වා වසර 2 ක කාලයක් ගත වී තිබුණද, තාක්ෂණික සහාය නොලැබීම හා පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රමාණවත් වගකීමක් අමාත්‍යාංශයේ අදාළ අංශ වලින් නොදැරීම හේතුවෙන් ඩිජිටල් අලෙවිකරණ වේදිකාව අසාර්ථක වී තිබීම හේතුවෙන් දරන ලද වියදම නිෂ්ඵල වී තිබුණි.. | 2023 වර්ෂයේ සිට ක්‍රමානුකූලව ව්‍යවසායක කාන්තාවන් මෙහි ලියාපදිංචි කරවීම පමණක් ආරම්භ කරන ලද බව. | අවශ්‍ය පහසුකම් සැලසීම මගින් වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අමාත්‍යාංශය යටතේ පවතින අංශයක් වූ ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අනුමත කාර්යය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිළධාරීන් 16 දෙනෙකු සේවයේ යොදවා සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා වේතන ලෙස රු.8,000,000 ක් ගෙවා තිබුණි. | ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ කාර්ය මණ්ඩලය සංශෝධනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව | අනුමත කාර්යය මණ්ඩලයට අදාල නිලධාරීන් පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2017 මාර්තු 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දිළිඳුකම පිටුදැකීම සඳහා පිහිටුවන ලද ග්‍රාම ශක්ති සමිති 3618 න් සමිති 2067 ක් එනම් සියයට 57 ක් පමණ අක්‍රීය මට්ටමේ පැවති අතර එම සමිතිවල වූ ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම්වල රු.635,705,116 ක මුදලක් නිශ්කාර්යව පැවතුණි. | ලියාපදිංචි මුළු සමිති 3696 හි සක්‍රියතාවය තහවුරු කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් පවතින අතර අක්‍රිය සමිති වලින් සක්‍රීය සමිති සඳහා රජයේ අරමුදල් පැවරීමේ කාර්යය දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින බව | ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම් වල තැන්පත් මුදල් අදාල අරමුණු වෙනුවෙන් වැය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 නොවැම්බර් 06 දිනැති සාර්ක් සංවර්ධන අරමුදලේ ප්‍රදාන ගිවිසුම මගින් ආරම්භ කරන ලද කාන්තාවන් හා ළමුන් සඳහා ගාස්තු රහිත උපකාරක සේවා ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය 2024 අප්‍රේල් 03 දක්වා දින දීර්ඝකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට එහි ප්‍රගතිය සියයට 30ක් පමණක් විය. | 2017-2020 ව්‍යාපෘතියේ මූලික කාල පරිච්ඡේදය වුවත් 2018 වර්ෂයේ අවසන් කාර්තුවේ මුදල් නොලැබීම, කෝවිඩ් වසංගත තත්ත්වය, ආර්ථික අර්බුදය, මුදල් නිසි පරිදි නොලැබීම හේතු මත එම කාලපරිච්ඡේදය තුළ දී ක්‍රියාත්මක වීමට නොහැකි වූ බව. | ණය ආධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝගී කරගත යුතුය. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 5කට පෙර සිදුවී තිබූ වාහන අනතුරු 2කින් සිදුවී තිබූ රු.5,257,895ක අලාභ මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව රු.3,450,945 ක කපා හැරීම සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇති අතර රක්ෂණ වන්දි මුදලින් ආවරණය නොවූ ඉතිරි මුදල අමාත්‍යාංශයෙන් ගෙවීමට කටයුතු කර ඇති බව. | අදාල වගකිව යුතු නිලධාරීන්ගෙන් අලාභ හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |